සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 08 - 2023**

## ක්‍රිස්තු ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I - කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා ලබා දී ඇති ප්‍රශ්නවලට ගැළපෙන වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) දෙවියන් වහන්සේගේ ස්වරූපය හා සමානාත්මතාවය අනුව මිනිසා මවන ලද බව සඳහන් වන ග්‍රන්ථය වන්නේ,
(i) එළිදරව්ව ය (ii) උත්පත්තිය (iii) නික්මයාම ය (iv) ලූක් ය

(02) අයකැමියෙකු ලෙස බදු පොළේ සිටියදී කැඳවීම ලැබූ ගෝලයෙකු වන්නේ,
(i) පේදුරු තුමාය (ii) ලූක් ය (iii) යොහාන්ය (iv) මතෙව්ය

(03) ''මොහුත් ආබ්‍රහම්ගේ පුත්‍රයෙකි'' යනුවෙන් යේසුස් වහන්සේ පැවසුවේ කවුරුන් පිළිබඳවද?
(i) සිමොන් (ii) සාකෙවුස් (iii) පේදුරු (iv) යොහන්

(04) ගලීල මුහුද සඳහා යෙදෙන තවත් නමක් වන්නේ,
(i) රතු මුහුද (ii) මළ මුහුද (iii) මධ්‍යධරණී මුහුද (iv) තිබේරියස් මුහුද

(05) යේසුස් වහන්සේ ශ්‍රාවකයන් දොළොස් දෙනා පිටත්කර හරිමින් ඔවුන්ට පැවසීමට නියම කළ ප්‍රධාන පණිවිඩය වන්නේ,
(i) යේසුස් වහන්සේ මොහොතකින් වඩින බවය
(ii) ස්වර්ග රාජ්‍ය ළංවී ඇති බවය
(iii) පසුතැවිලි විය යුතු බවය
(iv) යේසුස් වහන්සේ පිළිගැනීමට උත්සවයක් සූදානම් කළ යුතු බවය.

(06) යේසුස් වහන්සේගේ දූත සමයේ පලස්තීනය යටත් කරගෙන සිටි අධිරාජ්‍යයා වනුයේ,
(i) මිසර අධිරාජ්‍යයා (ii) අසිරියානු අධිරාජ්‍යයා (iii) රෝම අධිරාජ්‍යයා (iv) ග්‍රීක අධිරාජ්‍යයා

(07) ආබ්‍රහම්ගේ පෙර නම වූ ''ආබ්‍රම්'' යන්නෙහි අර්ථය වනුයේ,
(i) ජාතීන්ගේ පියා (ii) උතුම් පියා (iii) විශ්වයේ පියා (iv) සැමගේ පියා

(08) ''ස්වාමීනි ඔබ කැමති සේක් නම් මා පවිත්‍ර කරන්න ඔබට පුළුවන'' යැයි පැවසූ රෝගියා වූයේ,
(i) අංශභාග රෝගියාය (ii) යායිරස්ගේ දියණියයි
(iii) ලාදුරු රෝගියාය (iv) ගොළු බිහිරි රෝගියාය

(09) යේසුස් වහන්සේ සිය ප්‍රථම දේශනය සිදුකළේ,
(i) ගලීල මුහුද ළඟය (ii) නාසරෙත් ධර්මශාලාවේදීය
(iii) පාළුකරයේදීය (iv) තැනිතලාවේදීය

(10) පැරණි ගිවිසුමේ අඩංගු පොත් ගණන වනුයේ,
(i) 66 (ii) 27 (iii) 39 (iv) 40

(11) දෙබෝරා වනාහි
(i) ශ්‍රාවිකාවකි (ii) පූජකවරියකි (iii) ධර්මදූත සේවිකාවකි (iv) විනිශ්චයකාරවරියකි

(12) ඊශ්‍රායෙල් සෙනගට කාන්තාර ගමනේදී දිවා කාලයේ මඟ පෙන්වූයේ,
(i) වළා ටැබක්ය (ii) ගිනි ටැබක්ය (iii) විශාල ආලෝකයක්ය (iv) ගිනි සහ වළ ටැඩක්ය

(13) කිසිදු ප්‍රතිඋපකාරයක් බලාපොරොත්තු නොවී අන් අයගේ අවශ්‍යතාවයන් සැපිරීමට ඉදිරිපත් වීම
(i) සාමයයි (ii) ප්‍රීතියයි (iii) ඉවසීමයි (iv) ප්‍රේමයයි

(14) මච්කුස පිළිසිඳ ගැනීමටත් පෙර දිව්‍යසිවර සේවයට කැඳවනු ලැබුවේ,
(i) යෙසායා ය. (ii) එසකියෙල් ය. (iii) ජෙරමියා ය. (iv) නෙහෙමියා ය.

(15) මැලේරියා රෝගීන් අතර මහඟු සේවයක් ඉටු කළ විදේශීය ජාතික කාන්තාව වන්නේ,
(i) ජොයිස්ද සිල්වා ය. (ii) ඊඩා ප්‍රනාන්දු ය. (iii) තෙරේසා මච්තුමිය ය. (iv) ඉව්ලින්කානි ය.

(16) දේව කැමැත්ත ඉටු කිරීම උදෙසා අප කළ යුතු වන්නේ,
(i) ප්‍රශංසා මෙහෙයන්ට සහභාගී වීම
(ii) සෑම ඉරිදාම පල්ලි යාම
(iii) දේව ගුණාංග ජීවිතයෙන් පෙන්වීම
(iv) අප අවට පරිසරය පිරිසිදු කිරීම

(17) යේසුස් වහන්සේ මෙලොවට වැඩීමේ මූලික පරමාර්ථය වූයේ,
(i) ගැළවීම උරුම කර දීමය. (ii) මරණය ලබා දීම
(iii) පාපය උරුම කර දීම (iv) තෑගි ලබා දීම

(18) ජෙරුසලම් පවුර ගොඩනැගීමට මූලිකව කටයුතු කළේ,
(i) එළියාය. (ii) නෙහෙමියාය. (iii) එලිෂාය. (iv) හොෂියාය.

(19) ශුද්ධාත්ම දීමනා අපට ලැබී ඇත්තේ,
(i) එකිනෙකා අතර බලය පෙන්වීමටය.
(ii) අපගේ පෞද්ගලික ජීවිතය ශක්තිමත් කර ගැනීමටය.
(iii) සභාවේ භෞතික සම්පත් දියුණුවට අතහිත දීමටය.
(iv) එකිනෙකා දිරිගන්වමින් කිතුනු සභාව ශක්තිමත් කිරීමටය.

(20) යේසුස් වහන්සේ සීමොන් පේදුරුට භාරදුන් වගකීම වන්නේ,
(i) මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්න.
(ii) මාගේ බැටළුවන්ට ආදරය කරන්න.
(iii) මාගේ බැටළුවන් නොමඟ නොයවන්න.
(iv) මාගේ බැටළුවන්ගේ එඬේරා වන්න.

## II - කොටස

• පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න. කෙටි පිළිතුරු සපයන්න.

(01) (i) දේව මැවිල්ල සුරකීමට ඔබට දායක විය හැකි ආකාර දෙකක් ලියන්න.

(ii) යුදෙව් සමාජය විසින් කොන්කරන ලද ජන කණ්ඩායම් දෙකක් නම් කරන්න.

(iii) යේසුස් වහන්සේගේ මෙහෙවරට කැපවූ මෑත කාලීන ධර්මදූතිකාවන් දෙදෙනෙකු නම් කරන්න.

(iv) යේසුස් වහන්සේගේ ගෝලයන් වූ සෙබදීගේ පුතුන් දෙදෙනා නම් කරන්න.

(v) ඊසාක් හා රෙබෙකාගේ පුතුන් දෙදෙනා නම් කරන්න.

(vi) පංච පුස්තකයේ ප්‍රධාන කතුවරයාණන් නම් කරන්න.

(vii) යේසුස් වහන්සේ මරණය අභිබවා කළ ප්‍රාතිහාර්ය දෙකක් ලියන්න.

(viii) කිතුනු දරුවෙකු වන ඔබ තුළ තිබිය යුතු යහපත් ගුණාංග දෙකක් ලියන්න.

(ලකුණු 2 × 8 = 16)

(02) (i) යේසුස් වහන්සේ මුල් ගෝලයන් කැඳවනු ලැබූයේ කොහේදි ද?

(ii) මුල් ගෝලයන් තිදෙනෙකු නම් කරන්න.

(iii) දේව දරුවකු වන ඔබට දේව කැඳවීමක් ලැබුණොත් ඔබ ක්‍රියාකරන ආකාර තුනක් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

(03) (i) ශුද්ධ බයිබලයේ මුල් පොත් පහ හඳුන්වන නම් දෙකක් ලියන්න.

(ii) දස පනතෙහි මුල් පනත් තුන ලියන්න.

(iii) සාරධර්ම සහිත සමාජයක් ගොඩනැගීමට දසපනතින් ලබා ගන්නා මඟ පෙන්වීම් තුනක් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

(04) (i) ආදී පියවරු යනු කවුදැයි හඳුන්වන්න.

(ii) බයිබලයේ සඳහන් ආදී පියවරු තිදෙනෙක් නම් කරන්න.

(iii) කිතුනු දරුවෙකු ලෙස දේව මෙහෙවරෙහි යෙදීමට අවශ්‍ය මඟපෙන්වීම ඉල්ලා කරනු ලබන යැදුමක් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

(05) (i) ශුද්ධාත්ම දීමනා දෙකක් ලියන්න.

(ii) ඔබ ලබා ඇති දේව දීමනා දේව ගෞරවය සඳහා යොදා ගන්නා ආකාර තුනක් ලියන්න.

(iii) ඔබ පවුලේ අයෙකු රෝගී වූ විට කරන යැදුමක් ලියන්න. (ලකුණු 2+3+6 = 11)

(06) (i) දෙවියන් වහන්සේ මිනිසා නිර්මාණය සඳහා ගනු ලැබුවේ මොනවාද? ජීවය ලැබුවේ කෙසේද?

(ii) දේව මැවිල්ල තුළ මිනිසාට ලැබී ඇති අසමසම තත්වය කුමක්ද?

(iii) ඔබගේ මිතුරා හෝ මිතුරිය වරදට පෙළඹෙන අවස්ථා දෙකක් ලියා ඉන් මිදීමට ලබා දෙන උපදෙස් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

(4) WWW.PastPapers.WiKi (3)

Download Term Test Papers, Short Notes From One Place!

(4) WWW.PastPapers.WiKi (4)

Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 08 - 2023**

# ක්‍රිස්තු ධර්මය

## පිළිතුරු පත්‍රය

### I - කොටස

| | | | |
|---|---|---|---|
| (01) - (ii) | (06) - (iii) | (11) - (iv) | (16) - (iii) |
| (02) - (iv) | (07) - (ii) | (12) - (i) | (17) - (i) |
| (03) - (ii) | (08) - (iii) | (13) - (iv) | (18) - (ii) |
| (04) - (iv) | (09) - (ii) | (14) - (iii) | (19) - (iv) |
| (05) - (ii) | (10) - (iii) | (15) - (iv) | (20) - (i) |

(ලකුණු 2 × 20 = 40)

### II - කොටස

(01) (i) පරිසරය පවිත්‍ර කිරීම, ගස්වැල් වැවීම, වනාන්තර ආරක්ෂා කිරීම.
(ii) කාන්තාවන්, දරුවන්, රෝගීන්, සමාරිතයන්
(iii) එලීෂා ඇග්නිව්, ජොයිස්ද සිල්වා
(iv) යාකොබ්, යොහන්
(v) ඒසව් සහ යාකොබ්
(vi) දෙවියන් වහන්සේ
(vii) යායිරස්ගේ දියණිය මළවුන්ගෙන් නැගිටුවීම
නායින්නුවර වැන්දඹුවගේ පුත්‍රයා මළවුන්ගෙන් නැගිටුවීම
(viii) කීකරුකම, දයාව, ආදරය, ප්‍රේමය ආදිය (ලකුණු 2 × 8 = 16)

(02) (i) ගෙනසෙරෙත් විල හෙවත් ගලීල මුහුද අසල (ලකුණු 2)
(ii) පේදුරු, අන්ද්‍රා, යාකොබ්, යොහන් (ලකුණු 3)
(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 6)

(03) (i) පංච පුස්තකය/ ටෝරාව (ලකුණු 2)
(ii) මා හැර අන් දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතුයි.
රූප වන්දනා නොකළ යුතුය. (ලකුණු 3)
දෙවියන් වහන්සේගේ නාමය අගරු ලෙස භාවිත නොකරන්න.
(iii) සිසුවා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න (ලකුණු 6)

(2) WWW.PastPapers.WiKi (1)

Download Term Test Papers, Short Notes From One Place!

(04) (i) දෙවියන් වහන්සේගේ සැලැස්ම ඉදිරියට ගෙන යාම සඳහා විශේෂාකාරයෙන් කැඳවන ලදුව, එයට අවනතව දේව මෙහෙවර මැනවින් ඉටු කළ පුද්ගලයින් (ලකුණු 2)

(ii) ආබ්‍රහම්, ඊසාක්, යාකොබ් (ලකුණු 3)

(iii) ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු 6)

(05) (i) ආත්මයාණන් මගින් උපදෙස් දීමේ ප්‍රඥාව

ආත්මයාණන් තුළ විශ්වාසය

ශුද්ධාත්මයාණන් මගින් ධර්මය පහදා දීමේ ඥානය

භාෂ්කම් කිරීමේ බලය වැනි පෙළ පොතේ පිටු අංක 47, 48 අනුව (ලකුණු 2)

(ii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 3)

(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 6)

(06) (i) දූවිල්ල/ ජීවන හුස්ම හෙළීම (ලකුණු 2)

(ii) දේව ස්වරූපය අනුව මැවීම (ලකුණු 3)

(iii) සුදුසු පිළිතුරට ලකුණු ලබා දෙන්න (ලකුණු 6)

(2) WWW.PastPapers.WiKi (2)



Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න